**ශීර්ෂය 258 - මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම සහ සැසඳුම් ප්‍රකාශය මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශනයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

**1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම**

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියලුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියලු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන විෂය පථය**

---

ශීර්ෂය 258 - මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනිම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ජූලි 30 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.4 විගණන නිරීක්ෂණය**

---

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.3 ඡේදයේ සිට 2.15 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටු කිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය.

| මුදල් රෙගුලාසි | මුදල් රෙගුලාසි 128(1) ප්‍රකාරව ගණන්දීමේ නිලධාරිගේ ගිණුම් කටයුතුභාවය | ගණන්දීමේ නිලධාරි එම විධිවිධානයට අනුගත වී නොතිබීම | නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|---|
| **128(1)(අ)** | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලැකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනිමට පරිශ්‍රමයක් දක්වා තිබීම | 1. ක්‍රියාකාරී සැලැස්ම නිවැරදි ලෙස පිළියෙල කර නොතිබීම | 2.3.1 |
| | | 2. ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්ය භාරය ඉටු නොකිරීම | 2.3.2 |
| | | 3. ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාණවත් පරිදි සැලැසුම් නොකිරීම | 2.4.1 (අ) (ආ) |
| | | 4. අයවැය ඇස්තමේන්තු තාත්ත්වික ලෙස පිළියෙල නොකිරීම | 2.10 (අ) |
| **128(1)(ඇ)** | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේදී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව. | 1. තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවා ගැනීමේ ප්‍රමාදය | 2.12 |
| | | 2. තැන්පත් ගිණුමේ අඩුපාඩු | 2.13 |
| | | 3. අනුකූල නොවීම් | 2.14 |
| **128(1)(ඉ)** | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාක්ෂණය | නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් | 2.5 |

| | | | |
|---|---|---|---|
| | කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශණය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව | | |
| **128(1)(ඌ)** | හිඟව තිබෙන ගාස්තු යනාදිය අයකර ගැනිමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්ය පැවැරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අයකර ගැනීම කඩිනම් කිරීමට ගනු ලැබූ පියවර පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාර්තා කරන බව, | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට අපොහොසත්වීම | 2.11 |
| **128(1)(එ)** | රජයේ කටයුතු ඉටු කිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව, විධිමත්බව හා අවංකභාවය යන කරුණු පිළිබඳ නිසි සැලකිල්ලෙන් යුක්තව තම දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යන බව | 1. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු<br>2. අවිධිමත් ගනුදෙනු<br>3. කළමනාකරණ දුර්වලතා<br>4. අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් එවා ඇති ප්‍රතිපාදන උපයෝජනය කිරීමේ අඩුපාඩු | 2.4.2<br>2.6<br>2.9<br>2.10 |
| **128(1)(ඡ)** | නිලධාරීන්ගේ/සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලැකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/සේවකයන් මත අධිභාර පනවනු ලබන බව (වගබලා ගැනීම පිණිස ප්‍රමාණවත් විධිවිධාන යෙදීම විශේෂයෙන් ඔහුගේ යුතුකම් භාරය වන්නේය.) | මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු | 2.7 |

## 2. ප්‍රමාණවත් හා වැදගත් විගණන නිරීක්ෂණ

------------------------------------------

## 2.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යභාරයන්

-----------------------------------------------------

(අ) දිස්ත්‍රික් පරිපාලනය
(ආ) ව්‍යවස්ථාපිත කටයුතු
(ඇ) අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම
(ඈ) ආගමික හා සදාචාර සංවර්ධනය
(ඉ) සේවක සුභසාධනය
(ඊ) සම්බන්ධීකරණ හා මිත්‍රශීලී පරිපාලනය
(උ) සංවර්ධන වැඩසටහන් හා ගම නැගුම
(ඌ) රාජ්‍ය නොවන සංවිධාන හා ප්‍රජා සහභාගිත්වය
(එ) මාධ්‍ය සම්බන්ධීකරණය
(ඒ) පරිපාලනයේ ආකල්ප වර්ධනය හා පුහුණුව
(ඔ) තොරතුරු තාක්ෂණය භාවිතය

## 2.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ආයතන හා එමගින් ඉටු කළ යුතු කාර්යභාරයයන්

------------------------------------------------------------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ස්ථාපිත කර ඇති ආයතන හා ඒවායේ කාර්යභාරය පහත දැක්වේ.

| | දිස්ත්‍රික් ලේකම් කාර්යාල යටතේ ඇති ආයතන | ස්ථාපිත කිරීමේ අධිකාරී බලය | කාර්යභාරය |
|---|---|---|---|
| i | උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 1992 අංක 58 දරන ප්‍රාදේශීය ලේකම් කාර්යාල පිහිටුවීමේ පනත | 1. සියලු රේඛීය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන නීත්‍යානුකූල විධිවිධාන තුළ සියලු කාර්යයන් සම්බන්ධීකරණය තුළින් මහජන සුභසාධනය හා සංවර්ධන කාර්යයන් ඉහළ නැංවීම.<br>2. කොට්ඨාශයේ සියලු ඉඩම් සම්බන්ධ කටයුතු.<br>3. වන සංරක්ෂණ , වනජීවී, සුරාබදු, මෝටර් වාහන, භූ විද්‍යා පතල් කැනීම්, වාරිමාර්ග,මැතිවරණ හාපුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තු ආදී අණපනත් වලින් පවරා ඇති රාජකාරී ඉටුකිරීම.<br>4. කොට්ඨාශය තුළ සමාජ සංවර්ධන කටයුතු මෙහෙයවීම හා ආපදා කළමනාකරණයට අදාළ කාර්යයන් ඉටු කිරීම.<br>5. රෙජිස්ට්‍රාර් රාජකාරී කටයුතු<br>6. රජයේ ආදායම් හා මූල්‍ය කටයුතු පිළිබඳ පාලනය හා මෙහෙයවීම. |
| ii | දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | | |
| iii | පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | | |
| iv | යටිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | | |
| v | උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | | |
| vi | පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | | |
| vii | දොළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | | |
| viii | මිණිපේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | | |
| ix | උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | | |
| x | ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | | |
| xi | කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | | |
| xii | පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | | |
| xiii | පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | | |
| xiv | අකුරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | | |
| xv | ගඟවටකෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | | |
| xvi | තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | | |
| xvii | පන්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | | |
| xviii | හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | | |
| xix | හතරලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | | |
| xx | මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | | |

**2.3 කාර්යසාධනය**

**2.3.1 සැලැසුම් කිරීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂයට අදාළ වාර්ෂික අයවැය පදනම් කර ගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර පැවතියද එක්සත් ජාතින්ගේ 2030 න්‍යාය පත්‍රයට අනුව යමින් තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක කර ගත් සැලැසුම් කර නොතිබුණි.

**2.3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**

**ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යභාරයන් ඉටු නොකිරීම**

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මූලධන ප්‍රතිපාදන යටතේ ව්‍යාපෘති 04 ක් ඉටු කළ යුතුව තිබුණි.ඉන් ව්‍යාපෘති 03 ක් පමණක් ඉටු කර තිබුණ ද රු.මිලියන 27 ක ප්‍රතිපාදන සලසා තිබුණු දෙල්තොට ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ගොඩනැගිල්ල ඉදිකිරීම කර නොතිබුණි. ඒ වෙනුවට රු.මිලියන 21.6 ක ප්‍රතිපාදන මත හාරිස්පත්තුව, පාතහේවාහැට හා පූජාපිටිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල ගොඩනැඟිලි ඉදිකර තිබුණි.

**2.4 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබා ගැනීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කරමින් සැපයුම් හා සේවා ලබාගත යුතු වූ රු.මිලියන 115.23 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 108.24 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. සලසා තිබුණු ප්‍රතිපාදනය සම්බන්ධයෙන් පිළියෙළ කළ යුතු ප්‍රසම්පාදන සැලැසුම් පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**2.4.1 ප්‍රසම්පාදනයන් සැලැසුම් කිරීම**

**(අ) ප්‍රසම්පාදන සැලැසුම් කිරීම සහ ප්‍රාරම්භක අවධිය**

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 මාර්ගෝපදේශයේ විධිවිධානයන්ගෙන් බැහැරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ දෙල්තොට, ගඟවට කෝරළේ හා යටිනුවර ප්‍රාදේශිය ලේකම් කාර්යාල විසින් 2017 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම 2017 වර්ෂයේදීම සකස් කර තිබුණි. එමෙන්ම ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම මාස 06 කට වැඩි නොවන කාලයක් තුළ යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි

(ii) ප්‍රසම්පාදන සැලැස්මේ එක් එක් ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීමට හා අවසන් කිරීමට නියමිත දිනයන් නිශ්චිතවම හඳුනාගෙන නොතිබූ අතර, සැලැසුම් කරන ලද අයිතම් හා වටිනාකම් ද ඇතුළත් කර නොතිබුණි.

**(ආ) පූර්ව කොන්ත්‍රාත් අදියරය**

**-----------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1(ඇ) මාර්ගෝපදේශය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඇතුලු ප්‍රාදේශිය ලේකම් කාර්යාල විසින් විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

(ii) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2017 වර්ෂයේ ක්‍රියාත්මක උඩුදුම්බර ප්‍රාදේශිය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව වෙනුවෙන් උපදේශන සේවා සඳහා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

(iii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.3 මාර්ගෝපදේශය අනුව අදියර 1 සහ අදියර 2 යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ව්‍යාපෘති සඳහා ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙල කර නොතිබුණි.

**2.4.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම**

**-----------------------------------------**

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, දෙල්තොට සහ ගඟවට කෝරළේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල ලංසු ආරාධනා කිරීමේදී කොන්ත්‍රාත්කරුවන්ගේ ස්වභාවය අනුව (ගොඩනැගිලි, මාර්ග, වාරිමාර්ග) අදාළ වර්ගීකරණය සඳහන් කිරීමකින් තොරව "ICTAD/CIDA ආයතනයේ සී – හෝ ඊට වැඩි වටිනාකමක වලංගු ලියාපදිංචිය පවතින කොන්ත්‍රාත්කරුවන්ගෙන් පමණි" වශයෙන් පමණක් සඳහන් කර තිබුණි.

(ආ) පස්බාගේ කෝරළේ හා උඩපළාත ප්‍රාදේශිය ලේකම් කාර්යාල විසින් සැපයුම්කරුවන්ගේ මිල ගණන් ලබා ගැනීමේදී සාමාන්‍ය තැපැලෙන් ලිපි යවා මිළ ගණන් ලබාගන්නා බව සඳහන් කර තිබුණි. නමුත්තැපැල් ලේඛනය පරීක්ෂා කිරීමේදීඅදාළ සැපයුම්කරුවන්ට සාමාන්‍ය තැපැලෙන් මිල කැඳවීමේ ලිපි යැවූ බවට තහවුරු නොවුණි.

(ඇ) දොළුව ප්‍රාදේශිය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීමේ අදියර iii, iv, v සඳහා ලංසු කැඳවිමේදී ඉදිරිපත් කළ ලංසුවල මිළ ගණන් සියල්ලම ගණිතමය නිවැරදිතාවයක් නොවූ මිළ ගණන් බව නිරීක්ෂණය විය. තවද, අදියර iii හා iv හි නිවැරදි කළ සියලු මිළ ගණන් පළමුව ඉදිරිපත් කළ ලංසුවලට වඩා ඉහළ ඉංජිනේරු ඇස්තමේන්තුව ද ඉක්මවූ අගයක් ගෙන තිබුණි.

(ඈ) දොළුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව,ඉංජිනේරු ඇස්තමේන්තුවට ඉටුකර ගැනීමට එකඟ කරවා ගෙන අවම මිල ගණන් ඉදිරිපත් කළ කොන්ත්‍රාත්කරු වෙත ප්‍රදානය කර තිබුණි. නමුත් ප්‍රසම්පාදන අත්පොතෙහි 7.9.2 (ආ), 8.1.1 හා 8.2.1 මාර්ගෝපදේශ අනුව කටයුතු කර නොතිබුණි.

(ඉ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.1 මාර්ගෝපදේශයේ හා ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ 3.4 (ඇ)(iii) ඡේදය අනුව ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් ලංසු කැඳවන අවස්ථාවලදි, අවස්ථා 02 කට වැඩි ප්‍රමාණයක් ලංසු ඉදිරිපත් නොකරන ලද කොන්ත්‍රාත්කරුගේ ලියාපදිංචිය ඉවත් කළ යුතුව තිබුණි. නමුත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ගඟවට කෝරළේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය එම විධිවිධානයෙන් බැහැරව කටයුතු කර තිබුණි.

(ඊ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගොඩනැගිලි හා මාර්ග සඳහා කොන්ත්‍රාත්කරුවන් 660 ක් ලියාපදිංචි වී තිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ගඟවට කෝරළේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ පිළිවෙලින් 2017 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා හා 2017 ජනවාරි සිට දෙසැම්බර් දක්වාත් කාල පරිච්ඡේදයන් තුළ පිළිවෙලින් කොන්ත්‍රාත්කරුවන් 28 දෙනෙකුගෙන් හා 16 දෙනෙකුගෙන් පමණක් ලංසු කැඳවා තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන 16 ක් කොන්ත්‍රාත්කරුවන් 08 දෙනෙකු අතරේ බෙදී ගොස් තිබුණු බැවින් කොන්ත්‍රාත් සුළු පිරිසක් අතරේ බෙදී ගොස් තිබුණු බව නිරීක්ෂණය විය.

## 2.5 වත්කම් කළමනාකරණය

-----------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

**නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

-------------------------------------------

විගණන හා කළමනාකරණ කමිටුවෙන් ලබාදුන් උපදෙස්වලින් බැහැරව යටිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පවත්වාගෙන යනු ලබන විද්‍යා සම්පත් මධ්‍යස්ථානයේ ආහාර විජලන යන්ත්‍රය නිෂ්ක්‍රීයව කාර්යාලයෙන් පිටත ගබඩාවක තිබුණි.

## 2.6 අවිධිමත් ගනුදෙනු

---------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොරවිය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) වාණිජමය නොවන කාර්යයන් සඳහා වැලි, පස්, බොරළු ඉවත් කිරීම සඳහා නිකුත් කරන බලපත්‍රයකින් කියුබ් 02 ක් නොඉක්මවන ප්‍රමාණයක් ප්‍රවාහනය කළ හැකි වී තිබුණි. එසේ වුවද දෙල්තොට ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින්අවස්ථා 07 කදී කියුබ් 02 ඉක්මවූ වැලි හා පස් ප්‍රමාණයන් ප්‍රවාහනය කිරීම සඳහා එක් බලපත්‍රයක් නිකුත් කර තිබුණි.

(ආ) උඩපළාත ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ කැබ් රථය 2017 මැයි 25 දින අනතුරකට භාජනය වී රු.මිලියන 2.22 ක ඇස්තමේන්තුවකට පෞද්ගලික ආයතනයකින් අළුත්වැඩියාව සිදු කර, රක්ෂණ සමාගමින් රු.මිලියන 1.89 ක් ප්‍රතිපූර්ණ කර තිබුණි. එම හේතුවෙන් භාවිතයට ගත නොහැකි තත්ත්වයේ පැවති රථය වෙනුවෙන් රු. මිලියන 6.1 ක පූර්ණ රක්ෂණ ආවරණ හිමිකම ලබාගත නොහැකි වී තිබුණි. තවද,රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශය ප්‍රකාරව රු.200,000 ඉක්මවන මෝටර් වාහන අළුත්වැඩියාවන් සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.රථයේ වැසිය අළුත්වැඩියා කළ නොහැකි බවට මහනුවර දිස්ත්‍රික් මෝටර් රථ පරීක්ෂක නිර්දේශ ලබා දී තිබියදී වාහනය අළුත්වැඩියාව සඳහා භාරදී තිබුණි. 2018 මැයි මස වන විට අනතුර සිදුවී වර්ෂයකට අධික කාලයක් ගතවී තිබුණද කැබ් රථය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත අළුත්වැඩියා කර ආපසු ලබා දී නොතිබුණි. මේ පිළිබඳ මුදල් රෙගුලාසි 104(4) අවසන් පරික්ෂණ වාර්තාවක් මේ දක්වා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) ගහඉහළ කෝරලේ ප්‍රාදේශිය ලේකම්ගේ නිල රථය 2015 ජුනි 11 දින අනතුරට ලක්ව තිබුණි. එහි අළුත්වැඩියා ඇස්තමේන්තුව රු. මිලියන 3.4 ක් විය. මෙම අළුත්වැඩියාව සඳහා රක්ෂණ සමාගමෙන් රු.මිලියන 2.97 ක මුදලක් ලැබී තිබුණි. තවදුරටත් අළුත්වැඩියාව සඳහා ගෙවිය යුතු රු.430,166 ක හිඟ මුදලට, අදාළ සමාගමෙන් ඉල්ලීමකින් තොරව මිළ වාසිය ලැබී තිබුණි. තවද අනතුරු සම්බන්ධ විධිමත් පරික්ෂණ පවත්වා වගකිව යුතු පාර්ශවයන් තීරණය කර නොතිබුණු අතරඅළුත්වැඩියාව සඳහා අමාත්‍යාංශ අනුමැතිය ද ලැබී නොතිබුණි.

## 2.7 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

-------------------------------------------

දොළුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ නව ගොඩනැගිල්ල ඉදිකිරීම අදියර හතරකින් සිදුකර තිබුණි. එහි හතර වන අදියරේ කොන්ත්‍රාත් විෂය අංක 7-1 යටතේ පොළව මත ටයිල් ඇල්ලීම වෙනුවෙන් රු.මිලියන 1.6 ක මුදලක් ගෙවා තිබුණි.2017 ඔක්තෝබර් 17 දින භෞතික පරික්ෂාවේදී පළමු පන්තියේ ටයිල් වෙනුවට තත්ත්වයෙන් බාල දෙවන ගුණත්වයෙන් යුතු (2 nd Quality) ටයිල් ඇල්ලීම සිදුකර රු.91,423 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. තවද, අදියර v අංක 2.3, 6.5, 8.1 හා 10.1 යන වැඩ විෂයයන් ඉටු කර නොතිබියදී ඒ වෙනුවෙන් රු.320,300 ක මුදලක් ද අදියර v හී විෂය අංක 3.2 යටතේ R.R. MASONRY WORK සඳහා ඉටුකර තිබූ ප්‍රමාණයට වඩා 3.64$m^3$ ක් වෙනුවෙන් රු.50,960 ක මුදලක් ද වැඩිපුර ගෙවා තිබුණි.ගිවිසුම් ප්‍රකාරව 2016 දෙසැම්බර් 30 දිනෙන් අවසන් විය යුතුඅදියර iv 2017 ඔක්තෝබර් 17 දින වනවිටත් අවසන් කර නොතිබුණි. ඒ අනුව එදිනට ප්‍රමාද දින 259 ක් වෙනුවෙන් රු.435,120ක ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි.

## 2.8 විසඳා නොතිබුණු විගණන ඡේද

-------------------------------------

2008 වර්ෂයේ වාහන අනතුරකින් සිදුවූ රු.360,435 ක අලාභ හානිය සම්බන්ධයෙන් ගහඉහළ කෝරලේ ප්‍රාදේශිය ලේකම් වගකිව යුතු බැවින් එම අලාභය අයකර ගැනීමට2016 පෙබරවාරි 23 දින පවත්වන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව නියෝග අංක 2 මගින් නියෝග කර තිබුණද, 2018 ජුනි 30 දින වන විටත් රු.360,435 ක අලාභය අයකරගෙන නොතිබුණි.

## 2.9 කළමනාකරණ දුර්වලතා

----------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) ප්‍රාදේශිය ලේකම් කාර්යාල 03 කඅවස්ථා 11 කදී ඉඩම් අත්පත් කර ගැනීමේදී වර්ෂ 5 සිටවර්ෂ 45දක්වා කාල ප්‍රමාදයක් පැවතීම හේතුවෙන් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි.

(ආ) විශ්‍රාමිකයෙකු මිය ගිය විගස ග්‍රාම නිලධාරී විසින්, මිය යෑම පිළිබඳව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වෙත දැනුවත් කළයුතුව තිබුණි. නමුත් ප්‍රාදේශිය ලේකම් කාර්යාල 2 ක අවස්ථා 2 කදී මාස 05ක හා මාස 15 ක කාල පමාවකින් පසුව විශ්‍රාමිකයන්ගේ මියයාම් පිළිබඳව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට වාර්තා කර තිබුණි.

(ඇ) 2011 ජුනි 14 දිනැති අංක 2/2011 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය ප්‍රකාරව නොගෙවූ විශ්‍රාම වැටුප්, මාසයක් ගතවීමෙන් පසු විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතුව තිබුණි. නමුත් ප්‍රාදේශිය ලේකම් කාර්යාල 04 ක අවස්ථා 34 කදී මාස 1 සිට මාස 22 දක්වා

පරාසයක කාල ප්‍රමාදයකින් පසුව රු.මිලියන 1.2 ක නොගෙවූ විශ්‍රාම වැටුප් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත ප්‍රේෂණය කර තිබුණි.

(ඇ) ප්‍රාදේශිය ලේකම් කාර්යාල 5 කට අදාළව නිලධාරීන් 11 දෙනෙකු යතුරු පැදි ලබාගැනීමෙන් පසු යතුරුපැදි හිමි නොවන වෙනත් තනතුරුවලට මාරුවී ගොස් තිබුණි. 2017 අගෝස්තු 04 දිනැති අංක බීඩී/1/1/11/1/(උප)1/2017 දරන ලිපිය අනුව ඔවුන්ගෙන් යතුරු පැදියේ වෙළඳපොළ වටිනාකම වූ රු.975,920 ක මුදලක් ආපසු අයකරගෙන නොතිබුණි

## 2.10 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 922.39 | 922.39 | - | - |
| | මූලධන | 121.65 | 99.25 | 22.40 | 18.41 |
| | එකතුව | 1044.04 | 1021.64 | 22.40 | 2.15 |
| 2014 | පුනරාවර්තන | 823.47 | 820.38 | 3.09 | 0.37 |
| | මූලධන | 103.10 | 103.00 | 0.10 | 0.10 |
| | එකතුව | 926.57 | 923.38 | 3.19 | 0.34 |
| 2015 | පුනරාවර්තන | 1066.98 | 1066.79 | 0.19 | 0.02 |
| | මූලධන | 81.00 | 77.97 | 3.03 | 3.74 |
| | එකතුව | 1147.98 | 1144.76 | 3.22 | 0.28 |
| 2016 | පුනරාවර්තන | 1132.00 | 1118.42 | 13.58 | 1.20 |
| | මූලධන | 99.00 | 98.32 | 0.68 | 0.69 |
| | එකතුව | 1231.00 | 1216.74 | 14.26 | 1.16 |
| 2017 | පුනරාවර්තන | 1159.15 | 1103.51 | 55.64 | 4.80 |
| | මූලධන | 114.00 | 106.92 | 7.08 | 6.21 |
| | එකතුව | 1273.15 | 1210.43 | 62.72 | 4.93 |

සමාලෝචිත වර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### 2.10.1 කාර්යයන් ඉටු කිරීමට යෝජිත කාල රාමුව ගැන නොසලකා ප්‍රතිපාදන සලසා ගැනීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ගොඩනැගිලි සහ ඉදිකිරීම් කාර්ය ඉටු කිරීම සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුව අනුව අවශ්‍ය මුළු ප්‍රතිපාදනය සලසා ගෙන තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ශක්‍යතා අධ්‍යයනයන් හා ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාළ කාර්යයන් ඉටු කිරීමෙන් පසු මුළු ප්‍රතිපාදනයම උපයෝජනය කිරීමට නොහැකිවීම නිසා සලසා තිබුණු මුළු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 7 ක් හෙවත් සියයට 8 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

## 2.10.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

වෙනත් අමාත්‍යාංශ 30 ක් හා දෙපාර්තමේන්තු 17 ක් විසින් විවිධ කාර්යයන් සඳහා පිළිවෙලින් රු. මිලියන 3,334.09 ක් හා රු.මිලියන 466.25 ක් වශයෙන් එකතුව රු.මිලියන 3,800.34 ක් ප්‍රතිපාදන ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් එකතුව රු.මිලියන 3,669.86 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ලබා දී තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන130.48ක් හෙවත් සියයට 3.43 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. ඒ සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(අ) 2017 වර්ෂය තුළ විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු යටතේ රු.මිලියන 4,124.88 ක ප්‍රතිපාදන වෙන් කර දී තිබුණද, වර්ෂය තුළ ඒ ඒ අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුවලින් කිසිදු ලිඛිත ඉල්ලීමක් නොමැතිව රු.මිලියන 324.54 ක මුදලක් ආපසු පවරා දී තිබුණි. ඉන් රු.මිලියන 119.99 ක මුදලක් මූලධන ප්‍රතිපාදන පවරා දීම් විය.

(ආ) 2014 සැප්තැම්බර් මාසයේදී e-NIC වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් කුණ්ඩසාලේ හා අකුරණ ප්‍රාදේශිය ලේකම් කාර්යාලවලට ලිපිද්‍රව්‍ය තොගයක් හා පරිගණක හා උපාංග ලබා දී තිබුණි.කෙසේ වුවද, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව එය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබීමෙන් ලබා දී තිබූ උපකරණ නිෂ්කාර්යව පැවති අතර ලිපි ද්‍රව්‍ය විනාශ වෙමින් පැවතුණි.

(ඇ) ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ ලද රු.196,534 ක ප්‍රතිපාදනයෙන් හා ප්‍රදේශවාසින්ගේ රු.130,000 ක මූල්‍ය දායකත්වය මත ගඟවට කෝරළේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් වැලිගිරිය ප්‍රජාශාලාව හපුතලේ කඩුල්ල සහ වැලිගිරිය ග්‍රාමය යා කරන පාලමඉදිකර තිබුණි. මෙම ව්‍යාපෘතිය මඟින් නිවාස 4 ක ජීවත්වන ඉතා සීමිත පිරිසක් සඳහා ප්‍රතිලාභ සලසා තිබූ බව නිරීක්ෂණය විය. ඉදිකරන ලද පාලමට නුදුරින් වෙනත් පාලමක් තිබියදී මෙම පාලම ඉදිකිරීම තුළින් ප්‍රදේශයේ ප්‍රමුඛතාවය ලබා දිය යුතු වෙනත් සංවර්ධන කාර්යයකට මුදල් යෙදවීමට තිබූ අවස්ථාව මඟ හැරී ගොස් තිබුණි.

(ඈ) 2016 වර්ෂයේදී ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන හා පළාත් සභා මන්ත්‍රී ආධාර යටතේ පිළිවෙලින් රු.317,181ක් හා රු.38,127ක් වශයෙන් එකතුව රු.355,308 ක් වැය කර කුණ්ඩසාලේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් ප්‍රධාන මාර්ගයේ කෝවිල අසල සිට ශාන්ති මාවතේ අංක 172 නිවස දක්වා කානු පද්ධතිය සැකසීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. මේ සම්බන්ධයෙන් කළ භෞතික පරීක්ෂාවේදී කානු පතුල හා පැති බැම් කානුවට සම්බන්ධ වන ස්ථාන වැසි ජලයට සේදීමට ලක් වී තිබුණු බව නිරීක්ෂණය විය. පස් කැපීම සඳහා ඝණ මීටරයකට රු.900 ක් බැගින් 9.14 $m^3$ ක් වෙනුවෙන් රු.7,533ක් ද අදියර i අයිතම් අංක 03 යටතේ හා අදියර ii අයිතම් අංක 02 යටතේ 1.2.4 (3/4") මිශ්‍රණය මඟින් කොන්ක්‍රීට් කිරීමේදී තිබිය යුතු ඇස්තමේන්තු ගත ප්‍රමිතියෙන් තොරව උස, පළල හා ඝණකම පැවතීම හේතුවෙන් රු.31,720 ක් ද වැඩිපුර ගෙවා තිබුණි.

(ඉ) පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ සෑම ග්‍රාම නිලධාරී වසමක්ම ආවරණය වන පරිදි ළමා සමාජ පිහිටුවා ලියාපදිංචි කිරීමට කටයුතු කළ යුතු වුවද, ප්‍රාදේශිය ලේකම් කාර්යාල 5 ක ග්‍රාම නිලධාරී වසම් 285 කින් වසම් 122 ක් පමණක් ළමා සමාජ ලියාපදිංචි කර තිබුණි.

(ඊ) 31 ඇළ කපුවත්ත හා ගඟෙවත්ත (රබර්වත්ත) ගම් දෙක යාකරන පාලම ඉදිකිරීම පළාත් නිශ්චිත වැඩසටහන යටතේ මිණිපේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කර තිබුණි. සිදු වූ දෝෂ මත පාලම කඩා වැටීමට ලක්වීම හේතුවෙන් පරීක්ෂණ දිනය වූ 2017 අගෝස්තු 30 දින වන විටද ව්‍යාපෘතියේ අරමුණු ඉටු වී නොතිබුණි.

(උ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ මිණිපේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් වරාගොල්ල ගුරුළුපොත අලිවැට ඉදිකිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. මේ සම්බන්ධව පරික්ෂාවේදී, අලි වැටේ සිට එක් පසකට මීටර් 10 බැගින් කැළෑව එළි පෙහෙලි කිරීම කළ යුතු වුවද, මීටර් 05 ක ප්‍රමාණයක් දෙපස කැළෑ එළි කර තිබූ බව නිරීක්ෂණය වූ අතර ඒ සඳහා රු.529,931ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඌ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ මිණිපේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කර තිබුණි. අලි වැට ඉදිකිරීම් සඳහා මධ්‍ය මට්ටමෙන් 7 ඇළ වැල්ගාල විදුලි වැට ඉදිකිරීමේ ව්‍යාපෘතිය කැලෑව ශුද්ධ කිරීම වෙනුවෙන් මීටර් 10 ක් සඳහා රු.412,510 ක මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් සිදු කළ භෞතික පරික්ෂාවේදි අලිවැටේ සිට එක් පසකට මීටර් 10 වෙනුවට මීටර් 05 ක් පමණක් කැලෑව ශුද්ධ කර තිබුණි. ඒ අනුව අක්කරයකට රු.22,560 බැගින් අක්කර 9.14 ක ප්‍රමාණයක් සඳහා රු.206,251 ක මුදලක් කැලෑව ශුද්ධ කර නොතිබූ අක්කර 9.14 ක ප්‍රමාණයක් සඳහා යන්ත්‍ර උපයෝගී කරගෙන කැලෑව ශුද්ධ කිරීම වෙනුවෙන් අක්කරයකට රු.18,714 බැගින් රු.171,046 ක් ද වැඩිපුර ගෙවීම් සිදු කර තිබුණි. අලිවැට ඉදිකිරීමෙන් පසුව ද වැට කඩා නැවත අලි ගම්වැදීම හේතුවෙන් ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි.

(එ) ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ රු.මිලියන 3.8 ක ප්‍රතිපාදන මත දෙනුවර ත්‍රිපිටක ධර්මායතනය පිහිටි ඉඩමට පහළින් වූ අධික බෑවුම් සහිත කොටසේ උස මීටර් 4.7 ක් වූ බැම්මක් ඉදිකර නාය යාමේ අවධානම අවම කිරීමට පියවර ගෙන තිබුණි. කෙසේ වුවද, කන්ද ඉහළින්ම බුරුල් පස් ස්ථාවර කිරීමට ක්‍රියා මාර්ගයක් නොගැනීම හා පාමුල කොටසේ කුඩා බැම්මක් පමණක් ඉදිකිරීම සඳහා ගෙන තිබූ ක්‍රියාමාර්ගය හේතුවෙන් ව්‍යාපෘතිය අසාර්ථක වී තිබුණි.

(ඒ) 2016 වර්ෂයේ ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත නාවලපිටිය නගරයේ ගංවතුර තත්ත්වය අවම කිරීමේ ව්‍යාපෘතිය යටතේ - පැරණි කානු පද්ධතියක් තිබියදී අළුතින් කානු පද්ධතියක් සකස් කිරීම සඳහා රු.මිලියන 20 ක ප්‍රතිපාදන මත අදියර 02 කට, II සහ III වශයෙන් ඇස්තමේන්තු සකස් කර II අදියර සඳහා සීමිත මිල ගණන් කැඳවා රු. මිලියන 6.30 කට කොන්ත්‍රාත්තුව පිරිනමා රු. මිලියන 10.78 ක වියදමක් දරා තිබුණි. නිසි ශක්‍යතා අධ්‍යනයකින් හා සුපරීක්ෂණයකින් ද කාලගුණ තත්ත්වයන් ද සැලකිල්ලට ගැනීමකින් ද තොරව දුර්වල සැලසුම්කරණයක් හා ඇස්තමේන්තුගත කිරීමක් සිදුකර තිබුණි. ව්‍යාපෘතියෙන් සකස් කළ කානුවෙහි ජල පිවිසුම් දොරටුව කුඩා වීම හේතුවෙන් ජල මාර්ගය ඍජුව කානු පද්ධතියට ප්‍රවිෂ්ඨ වී නොතිබුණි. ජල ගැලීම් පාලනය කර ගැනීමට නොහැකි වීම හේතුවෙන් වැසි කාලයේදී මාර්ගය සහ අවට ප්‍රදේශය ජලයෙන් යටවීම නොවැලැක් විය හැකි වී තිබුණි. මේ හේතුවෙන් මෙම ව්‍යාපෘතිය සඳහා රජය දැරූ රු.මිලියන 10.78 ක මුදල නිශ්ඵල වියදමක් වී තිබුණි. එසේම මෙම ව්‍යාපෘතිය ඉටු කිරීමේ දී විහාරස්ථානයේ ගොඩනැගිල්ලක් ඉවත් කිරීම හා අනෙකුත් ගොඩනැගිලිවලට හානි සිදු වීම හේතුවෙන් රු.මිලියන 1.47 ක නව ගොඩනැගිල්ලක් ඉදි කර දීමට සිදු වී තිබුණි. තවද, කොන්ත්‍රාත් වටිනාකමට අමතරව, රු. මිලියන 2.81 ක අතිරේක වියදමක් රජයට දැරීමට සිදුවී තිබුණි. කානුවේ මීටර් 7 ක කොටසටද කොන්ක්‍රීට් වෙනුවට හියුම් පයිප්ප යොදා ගත්තේ නම් රාජ්‍ය මුදල් ඉතිරි කර ගැනීමට හැකියාවක් පැවති බව නිරීක්ෂණය විය.

(ඔ) ගුරුදෙණිය කොටසේ ජල ගැලීම් අවම කිරීම සඳහා මහනුවර දිස්ත්‍රික් අපදා අවම කිරීමේ ව්‍යාපෘතිය යටතේ රු.520,198 ක මුදලක් වැය කර ගඟවට කෝරළේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් පවුල් 05 ක් ආපදා තත්ත්වයෙන් මුදවා ගැනීමට කටයුතු කර තිබුණි. මෙම ව්‍යාපෘතිය හේතුවෙන් තවත් පවුල් දෙකකට වැසි ජලයෙන් ආපදා ඇතිවන බව නිරීක්ෂණය වූයෙන් ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට නොහැකි වී තිබුණි. තවද මෙම ව්‍යාපෘතිය මඟින් ඉදිකරන ලද කානුවේ ප්‍රමිත උස 1'9" ක් හා පැති බැම්මේ ඝණකම 4" ක් විය යුතුව තිබුණි. 2017 නොවැම්බර් 20 දින සිදු කරන ලද භෞතික පරික්ෂාවේදී එහි උස 1'7", 1'6",1'9" ආදි වශයෙන් හා ඝණකම 3.5", 3",4" ක් වශයෙන් පැවතුණි. ඒ අනුව කොන්ක්‍රීට් වෙනුවෙන් රු.10,889 ක මුදලක් ද වැර ගැන්වීම් රහිත කොන්ක්‍රීට් කඩා ඉවත් කිරීම වෙනුවෙන් රු.41,034 ක මුදලක් ද වැඩිපුර ගෙවා තිබුණි.

(ඕ) මහනුවර දිස්ත්‍රික්කයේ අකුරණ නගරයේ ගංවතුර තත්ත්වය අවම කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2014 සහ 2015 වර්ෂවලදී ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් රු.මිලියන 32.50 ක් මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ආපදා කළමනාකරණ අංශය වෙත ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් කරනු ලැබූ විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

**I. ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ගෙන් බැහැර වීම.**

**-----------------------------------------------**

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානයන්ගෙන් බැහැර කටයුතු කළ අවස්ථා පහත දැක්වේ.

(i) ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 26.21 ක් වූ ප්‍රසම්පාදන සම්බන්ධයෙන් ලංසු ලේඛනවල සම්පූර්ණ තොරතුරු විනිවිදභාවයකින් ඉදිරිපත් කර නොතිබුණි. තවද, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ සුදුසුකම් සපුරාලිය යුතු අවම ශ්‍රේණි අවශ්‍යතාවය සපුරා නොතිබුණු කොන්ත්‍රාත්කරුවකු වෙත කොන්ත්‍රාත්තුව පිරි නමා තිබුණි.

(ii) 4.3.1 මාර්ගෝපදේශයට අනුකූලවන පරිදි මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණි.

(iii) 5.3.10 මාර්ගෝපදේශයෙන් බැහැරව ප්‍රමාණවත් කාලයක් ආවරණය නොවූ ලංසු ඇපකර ලබාගෙන තිබුණි.

(iv) 5.4.11 සහ 5.4.12 මාර්ගෝපදේශයන්ගේ විධිවිධානයන්ගෙන් බැහැරව බදු ඉන්වොයිස්පත් ලබා ගැනීමෙන් තොරව කොන්ත්‍රාත්කරුට ගෙවීම් කර තිබුණි. තවද එකතු කළ අගය මත බදු විස්තර විගණකාධිපතිට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත දන්වා නොතිබීම හේතුවෙන් කොන්ත්‍රාත්කරු විසින් අදාළ ගෙවීම්වලදී රු.281,205 ක බදු මුදලක් අඩුවෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවා තිබුණි.

(v) 8.10.1 මාර්ගෝපදේශය අනුව ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්තුව පිළිබඳ ප්‍රසිද්ධියට පත් කිරීමේ කාර්යභාරය ඉටු කර නොතිබුණි.

(vi) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලින් බැහැරව කිසිදු ලංසු කැඳවීමකින් තොරව ශක්‍යතා අධ්‍යයනය වාර්තා සකස් කිරීම සඳහා රු.495,000 ක් ගෙවීම් කර තිබුණි.

(vii) රොන්මඩ කපා ඉවත් කිරීම හා ප්‍රවාහනය කිරීමේ වැඩ විෂයයන් සඳහා ඇස්තමේන්තු මුදලට වඩා ලංසුකරුවන් විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන් අසාමාන්‍ය ලෙස අඩුවීම, ලංසුකරුවන් එකිනෙකා මෙම වැඩ විෂයයන් දෙක සඳහා ඉදිරිපත් කරන ලද මිල ගණන්වල ඉතාමත් අසාමාන්‍ය විෂමතා පැවතීම හඳුනාගෙන නොතිබුණි. මිල ගණන් තාක්ෂණික පදනමකින් විශ්ලේෂණය කිරීම තාක්ෂණික ඇගැයීම් කමිටුව විසින් සිදුකර නොතිබුණි.ඒ අනුව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 2.6 මාර්ගෝපදේශයේ සඳහන් වගකීම තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඉටු කර නොතිබුණි.

**II. අදාළ පනත්වල සඳහන් විධිවිධානයන්ගෙන් බැහැරව කටයුතු කිරීම.**

---

අදාළ පනත්වල සඳහන් විධිවිධානයන්ගෙන් බැහැරව කටයුතු කළ අවස්ථා පහත දැක්වේ.

(i) 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතට අනුව කොන්ත්‍රාත් රෙජිස්ටාර් යටතේ ලියාපදිංචි කර නොතිබුණි.

(ii) 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත හා ඊට අදාළ සංශෝධනන්ගෙන් බැහැරව පස් / රොන්මඩ මීටර් කියුබ් 17,116 ක් කැණීම් කර ප්‍රවාහනය කර තිබුණි.

**III. ඇස්තමේන්තු සකස් කිරීමේ දුර්වලතා**

---

ව්‍යාපෘතියට අදාළ මුළු ඇස්තමේන්තුවෙන් සියයට 80 ක වැඩ ප්‍රමාණයක් නියොජනය කරන පස් කැපීම හා ප්‍රවාහනය කිරීමේ වැඩ විෂයයන් දෙක සඳහා සම්මත අනුපාතයකින් පදනම් කරගෙන ඇස්තමේන්තු සකස් කර නොතිබීම හේතුවෙන් රු. මිලියන 16.58 කට ආසන්න ප්‍රමාණයකින් අසාමාන්‍ය ලෙස අධි ඇස්තමේන්තු සකස් කර තිබුණි.

**IV විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම.**

---

රොන්මඩ/ පස් ප්‍රවාහනය කරන ලද ටිපර් රථවල දිග, පළල උස මැන ඒ පිළිබඳ වාර්තාවක් ලිපිගොනුවල නොතිබීමත් වැඩ පරීක්ෂකවරයාගේ මිනුම් වාර්තා කාලීනව වගකිව යුතු නිලධාරීන් විසින් පරීක්ෂා කර සහතික කර ඇති බවට ලේඛන නොතිබීමත්, රොන්මඩ/ පස් බැම සිදුකරන ලද ස්ථානයක් පිළිබඳව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හා ඉංජිනෙරු අංශයේ කිසිදු නිලධාරියෙකු දැන නොසිටීමත් ඇතුලු හේතූන් මත රොන්මඩ කපා ඉවත් කිරීම හා ප්‍රවාහනය කරන ලද කියුබ් ප්‍රමාණයේ නිවැරදිතාවය නිවැරදි ලෙසටම විගණනයේදී සනාථ කරගත නොහැකි විය.

**V කළමනාකරණ දුර්වලතා**

---

පහත සඳහන් කළමනාකරණ දුර්වලතා නිරීක්ෂණය කරනු ලැබේ.

(i) ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 26.21 ක ඇති කොන්ත්‍රාත්තුව කොන්ත්‍රාත්තුවක ගිවිසුමට අනුව 2015 නොවැම්බර් 14 දින වැඩ අවසන් කළ යුතු වුවද 2016 පෙබරවාරි 29 දින වන විටත් නිමකර නොතිබුණි. ගිවිසුමට අනුව දිනකට රු.4,700 බැගින් වූ ප්‍රමාද ගාස්තුව අයකර නොතිබුණි.

(ii) පටු ස්ථානවල ඇති අනවසර ඉදිකිරීම් ඉවත්කර පටු ස්ථාන පළල් කිරීමේ කාර්යය සම්පූර්ණයෙන්ම ඉටු නොකිරීම,මීටර් 1.25 කින් ගැඹුරු කිරීම සහ ඝන මීටර් 25,000 සිට 30,000 දක්වා රොන්මඩ ප්‍රමාණවත් පරදි ඉවත්කර නොතිබීම හා සුදුසු තැන්හි වැලි රැඳවුම් බැම් ඉදිකර තිබුණද එම වැලි ඉවත් කිරීමේ ක්‍රමවේදයක් 2018 අගෝස්තු 31 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබීම හේතුවෙන් මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ප්‍රමාණවත් පරිදි ඉටු වී නොතිබුණි.

**VI** වැඩිපුර ගෙවීම්

**------------------**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) පස්/ රොන්මඩ කැපීම, ප්‍රවාහනය කර ඉවත් කිරීමේ වැඩ විෂයයන් දෙක සඳහා සම්මත රේටයන් අනුව මිල ගණන්වලට වැඩි මිලක් ඇස්තමේන්තු කර තිබීම හේතුවෙන් විගණනයට ගණනය කළ හැකි තොරතුරුවලට අනුව රු.මිලියන 15.57 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ii) ව්‍යාජ ටිපර් රථයකින් රොන්මඩ / පස් ප්‍රවාහනය කරන බව සඳහන් කර ගෙවීම් කිරීම සහ ටිපර් රථවල තට්ටුවේ ප්‍රමිතිගත ධාරිතාවයට වඩා ව්‍යාජ ධාරිතාවයක් සඳහන් කර ටිපර් රථ හතරක් සඳහා රු. මිලියන 2.62 ක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණි.

(iii) රු.මිලියන 6.74 ක් වූ ප්‍රසම්පාදනයේ ගිවිසුම්ගත වටිනාකම රු.මිලියන 4.85 ක් විය. මෙම කොන්ත්‍රාත්කරුට අනුව රොන්මඩ ඝන මීටර 3000 ක් ඉවත් කර ප්‍රවාහනය කිරීම සඳහා ගිවිසුමට බැඳී තිබුණද ඝන මීටර් 4,416.76 ක් එනම් ඝන මීටර් 1,416.76 ක් සඳහා වැඩිපුර ගෙවීම් කර තිබුණි. එය ගිවිසුම්ගත මුදල සියයට 34 ක ඉක්මවීමකි.

(ක) ගඩලාදෙණිය විහාරස්ථානයේ කාමර (Cabin) හතරකින් යුත් වැසිකිළි පද්ධතියක් ඉදිකිරීම සඳහා සංචාරක හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය ප්‍රතිපාදන සලසා තිබුණි. කාර්යසාධන බැඳුම්කර ලබාගැනීමකින් තොරව කොන්ත්‍රාත්කරුවෙකුට රු. මිලියන 2.42 කට පවරා තිබුණි. වැසිකිළි පද්ධතියේ අත්තිවාරම පමණක් දැමීමෙන් අනතුරුව කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් කටයුතු අත්හැර දමා තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.11 මාර්ගෝපදේශය අනුව කොන්ත්‍රාත් පැහැර හරින කොන්ත්‍රාත්කරුවන්ට කොන්ත්‍රාත් පැවරීම නොකළ යුතු වුවද උඩුනුවර ප්‍රාදේශීය ලේකම් විසින් ඉහත කොන්ත්‍රාත්කරු සමඟ නැවත 2017 ඔක්තෝබර් 30 දින රු. මිලියන 2.65 කට කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කර තිබුණි. 2017 දෙසැම්බර් 22 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී මෙම වැසිකිළියේ පිල සහ ගෙබිමට යොදා තිබූ කොන්ක්‍රීට් මිශ්‍රණය සතුටුදායක නොවන බව නිරීක්ෂණය විය.

(ග) ගහවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලැසුම් දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන යටතේ 2017 ඔක්තෝබර් 25 දින රු.193,000 ක් වැයකර නිත්තවෙල පතහේ රොන්මඩ ඉවත් කිරීම සිදුකර තිබුණි. ජල මූලාශ්‍රය ආරක්ෂා කර ගැනීම හා එම ජලය ගොවිතැන් සඳහා යොදා ගැනීම මෙම ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණ වුවද, ඉහළින් පැමිණෙන ජලය සමඟ අපද්‍රව්‍ය හා රොන් මඩ පතහ තුළ තැන්පත් වීම වැලැක්වීම සඳහා සැලැසුම් සකස් කර නොතිබුණි. භෞතික පරික්ෂාවේදී මාස 2 ක් වැනි කෙටි කාලයක් තුළ 207.52$m^3$ක ප්‍රමාණයක් පස් තැන්පත් වී තිබුණු බව නිරීක්ෂණය විය. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබීමෙන් පතහ තුළ නිරන්තරයෙන් රොන් මඩ හා අපද්‍රව්‍ය තැන්පත් වීමහේතුවෙන්, ජල මූලාශ්‍ර විනාශ වීම සිදුවන බවත් නිරීක්ෂණය විය.

## 2.11 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ විෂය අංක 258011 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම |  | ලැබීම් |  | හර ශේෂය |  |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 75.00 | 74.51 | 60.00 | 65.14 | 250.00 | 205.52 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම**

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු වැඩ තහනම් කළ හා සේවය අතහැර ගිය නිලධාරීනෙගේ ණයශේෂවල එකතුව රු.849,482ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 14 ක් දක්වා කාල පරාසයක සිට පැවැතුණි.

## 2.12 අග්‍රිම ගිණුම

2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371 (5) ප්‍රකාරව කාර්යය නිමකර දින 10 ක් ඇතුළත ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුතු වුවත්, අවස්ථා 44 කට අදාළව ලබා දී තිබුණු එකතුව රු.785,012 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිමවී මාස ½ක සිට මාස 6 ක් දක්වා කාල පරාසයක ප්‍රමාදයකින් පසු නිරවුල් කර තිබුණි.

**2.13 පොදු තැන්පත් ගිණුම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වන පොදු තැන්පත් ගිණුම් 06 ක 2017 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 293.81 ක් විය. ඉන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක වර්ෂ 2 ඉක්මවූ (ඉඩම් තැන්පතු හැර) එකතුව රු.මිලියන1.42ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.14 අනුකූල නොවීම්**

**2.14.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය<br>xvi වැනි පරිච්ඡේදය | |
| (i)1.3.1 වගන්තිය | උඩපළාත ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ නිලධාරීන් දෙදෙනෙකුට අවස්ථා 04 කදී ආයතන සංග්‍රහයේ විධි විධානයන්ගෙන් බැහැරව පවුල යටතට නොගැනෙන සාමාජිකයින් සඳහාද දුම්රිය බලපත්‍ර නිකුත් කර තිබුණි. |
| (ii)1.3.4 වගන්තිය | යැපෙන්නන් පිළිබඳව ප්‍රමාණවත් තහවුරුවක් නොමැතිව උඩපළාත ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් අවස්ථා 3කදී නිලධාරීන් සඳහා දුම්රිය බලපත්‍ර නිකුත් කර තිබුණි. |

**2.14.2 කොන්ත්‍රාත් සම්බන්ධයෙන් බදු අයකර ගැනීම්**

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.11 මාර්ගෝපදේශය පරිදි වැට් බදු සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් වෙත ඉන්වොයිස් පත්‍රයක් ලබාගැනීමෙන් පසු කරන ලද වැඩ මත වැට් බදු ගෙවනු ලැබිය යුතු වුවත්, දොළුව ප්‍රාදේශිය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ අදියර iii, iv සහ v සඳහා ගෙවීම් කිරීමේදී කොන්ත්‍රාත්කරුගෙන් ඉන්වොයිස් ලබා ගැනීමකින් තොරව ගෙවීම් කර තිබුණි.

**2.15** **මානව සම්පත් කළමනාකරණය**

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

ඉහත 2.1 ඡේදයේ සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 994 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.292,167 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 111 | 87 | 24 |
| (ii) | තෘතියික මට්ටම | 59 | 32 | 27 |
| (iii) | ද්විතියික මට්ටම | 3454 | 3104 | 350 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 228 | 178 | 50 |
| | එකතුව | 3852 | 3401 | 451 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

මිණිපේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වසර 04 ක කාලයක සිට පැවත එන සේවක පුරප්පාඩු 09 ඇතුලුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට පැවති පුරප්පාඩු 451ක් පිරවීමට ආයතනය කටයුතු කර නොතිබුණි.